# ජාතික සුළු ජන කණ්ඩායම් වල අරගලය

## ඉරාන අත්දැකීම් 1979

එහි ආරම්භයේ සිටම ඉස්ලාමීය පාලන තන්ත්‍රය මත ප්‍රදේශබද ව්‍යනුකලනයේ භූතයාගේ හොල්මන් නිතර ගැවසුනි. කොමෙයිනිගේ ඉස්ලාමීය ධර්ම රාජ්‍යය සෙල් පවුරක් සේ දැඩි, යළි පවරාගත නොහැකි දේශපාලන ව්‍යුහයක් වූ අතර අත්‍යන්තයෙන්ම බලයේ මධ්‍යගත භාවය ඉස්ලාම් ධර්මයේ උරුමයක් විය. (තනි පුද්ගල අධිකාරියකට (අල්ලා ට) පූර්ණ යටහත්භාවය අදහස් වේ)

ඉරානය නිර්මිතව පැවතියේ විවිධ ජාතික සහ සුළු ජාතික කණ්ඩායම් වලිනි. (කුර්දි ජාතිකයන්, අරාබීන්, බලුකිස්තානුවන්, තුර්ක්වේනියානුවන්, අසර්බයිජානුවන් ආදී මිලියන 20 කට අධික ජන සංඛ්‍යාවක් වූහ.) කොමෙයිනීගේ සෙල් පවුරක් වන් වූ ඉස්ලාමීය පාලන තන්ත්‍රයට ඒකාබද්ධ වීමට මනාප නැති හෝ අකමැතිභාවය විවිධ තත්ත්වයන් යටතේ ඔවුන් පෙන්නුම් කළහ. පාලන තන්ත්‍රයේ ඒකායන අපේක්ෂාව වූයේ රටේ ජනතාව පූජක තන්ත්‍රය සහ ඉස්ලාමීය ධජය යටතේ ඒකරාශී කිරීමයි. එයට සමාජ අසහන සහ සමහර ප්‍රදේශවල සන්නද්ධ ප්‍රතිරෝධය දැක්වීම වැනි විවිධ රළ පහරවලට මුහුණ දීමට සිදුවිය.

කුර්දිස්ථානය - ප්‍රතිරෝධයේ ස්වාභාවික සෙල් පවුර -

1979 පෙබරවාරි මැද තරම් ඉක්මනින්ම සනාන්දාජ් කුර්දි නගරයේ සන්නද්ධ තරුණ කණ්ඩායම් නව ආණ්ඩුවේ නාගරික පොලිස් ප්‍රධානී අලි ජමායිඩි (Ali Jamashidi) අත්අඩංගුවට ගත්තේය. මෙම තත්ත්වය මුළු මහත් කුර්දිස්තානය පුරාම අත්‍යන්ත සංවේදී බවක් ගත්තේය. රාජ්‍ය ගුවන් විදුලියට අනුව 'කුර්දිස්තානයේ ප්‍රතිවිප්ලවකාරී කණ්ඩායම් සන්වේස්, බානේ, වාරිවාන් වැනි නගරවල මිලිටරි බැරැක්ක කරා ගමන් කිරීමට සැලසුම් කරන බව යි. පෙබරවාරි 23 දා සන්වේස් හි දවැන්ත උද්ඝෝෂණයක් පැවැත්වුනු අතර පෙළපාලිකරුවෝ ස්වපාලනය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළහ.

ඉරානයට ස්වාධිපත්‍යය !
කුර්දිස්ථානයට ස්වපාලනය !!

ප්‍රාන්ත ආණ්ඩුවේ උක්ත ස්වපාලනය උදෙසා වූ කුර්දි ඉල්ලීම්වලට දැක් වූ ප්‍රතිචාරය අවුල් සහගත විය. එක් අතකින් කම්කරු සහ සමාජ කටයුතු පිළිබඳ අමාත්‍ය ඩාර්යුෂ් ෆෝරුහර් ට (Darivsh Foruhar) කුර්දි ප්‍රශ්නය පිළිබඳ පරීක්ෂා කිරීමට පවරන ලදී. අනෙක් අතට ප්‍රකෝපකාරීත්වය මත වූ අසහනකාරී තත්ත්වය තලා දැමීමට ප්‍රතිඥා දෙන ලදී. කෙසේ වෙතත් කොමෙයිනී මුරණ්ඩු ලෙස ප්‍රකාශ කර සිටියේ '........රටෙහි පවතින සියළු දේශපාලන පක්ෂ - කුර්දි ප්‍රශ්නය උදාහරණයක් ලෙස ගෙන - ඉස්ලාමීය රාමුව තුළ ක්‍රියා කළ යුතු බවයි. .......' කුර්දීහු අනම්‍ය වූහ. බලපෑම් වලට යටත් නොවූහ. ශෙයික් ඉසේදීන් හුසේනි (Sheikh Essedin Husseni) නම් කුර්දි ප්‍රශ්නය පිළිබඳව කෙළින් කතා කරන එක් රැඩිකල් නායකයෙකු 1979 මාර්තු මාසයේදී ප්‍රකාශ කළේ ".....අපට ජාතික ස්වපාලනය පිළිබඳ ප්‍රශ්නය සාමකාමී ආකාරයෙන් විසඳා ගැනීමට නොහැකි නම් අපි එය විසඳීම සඳහා වෙනත් මාර්ග සොයා ගන්නෙමු........" යනුවෙනි.

බොහෝ නගරවල සහ ගම් වල පාලනය යථාර්තයෙන්ම කුර්දීහු සතු වූහ. මහාබාද් හි පාලනය කුර්දි විප්ලවකාරී කමිටුව යටතේ විය. කුර්දි ගරිල්ලාවරු ඔවුන්ගේ අයිතිවාසිකම් සඳහා සටන් කිරීමට කඳු සහිත ප්‍රදේශවල හොඳින් ස්ථාන ගත වූහ.

කුර්දිස්ථානයේ සියළු වැදගත් දේශපාලන ව්‍යාපාර සහ බලපෑම් කළ හැකි පුද්ගලයින් (අබ්දුල් රහුමාන් කාසිම්ලූ නායකත්වය දරණ කුර්දි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය KDP, පරිශ්‍රම යොදන්නන්ගේ විප්ලවකාරී සංවිධානය Toilers, Komla සහ ඉසේඩීන් හුසේන්) එක් මූලික කරුණක් පිළිබඳව එකඟ වූහ. එනම් ".....ස්වයංතීරණය යනුවෙන් අදහස් වන්නේ වෙන්වීමක් හෝ ඉරානයෙන් ස්වාධීනත්වය ලබා ගැනීමක් නොවන බවත් ඒ නමුත් ස්වපාලනය සඳහා වූ අයිතියයි..."මෙය මෙසේ විස්තර කළ හැක. කුර්දි පරිපාලන ව්‍යුහයක් ඇති කර ගැනීමේ අයිතිය, ප්‍රදේශයේ ප්‍රථම භාෂාව කුර්දි භාෂාව විය යුතු බව, විදේශ සම්බන්ධතා, රාජ්‍ය ආරක්ෂාව, දීර්ඝකාලීන ආර්ථික සැලසුම් හැරුණු විට සෙසු සියළු කරුණු ප්‍රාදේශීය කුර්දි පාලන අධිකාරියක් යටතේ සිදුවිය යුතු බවත් ය. ස්වපාලනය පිළිබඳ ඉල්ලීම ආගම පිළිබඳ කාරණයට අදාල වූවක් නොවන බවත්ය. (ඔවුහු වැඩිමණත්ම සුන්නි මුස්ලිම් වරු වූ අතර ශායිට් මුස්ලිම්වරු නොවූහ යන පදනම යටතේ) 1979 පූර්ව භාගයේදී ම මෙම ඉල්ලීම් කොමෙයිනී වෙත ඉදිරිපත් කරන ලද අතර ඒවා බිහිරි දෙසවන් මත ලූවක් විය. ඉරාන හමුදා කුර්දි සටන්කාමීන් අතර ගැටුම් මාර්තුවේ දී ආරම්භ විය. මෙහි ආරම්භය සනාන්දාජ් හි හමුදා නැවතුම් පල වෙත ආයුධ සහ පතුරම් සියල්ල භාරදෙන ලෙස කරන ලද ඉල්ලීම් සමඟිනි. ඉරාන හමුදා මෙය ප්‍රතික්ෂේප කිරීමත් සමඟ ම කුර්දි සටන්කාමීහු හමුදා නවාතැන් පොල වටලන ලදී. ගුවන් විදුලිය, පොලීසිය, ප්‍රාදේශීය හමුදා මූලස්ථානය අත්පත් කර ගන්නා ලදී. ගරිල්ලාවරු තමන්ගේ ම විප්ලවකාරී කමිටුවක් පත් කරගන්නා ලද්දේ පූර්ව කොමෙයිනි විරුද්ධ පාර්ශවය වෙනුවටයි. (Komiteh)

දින 03 කට පසුව දරුණු සටන්වලින් අනතුරුව මධ්‍යම ආණ්ඩුව තත්ත්වය පාලනය කර ගත් අතර එසේ වූයේ ස්වපාලනය සඳහා වූ පොරොන්දුවක් ද සහිතවයි. මෙම සැලසුම තත්ත්වය සමනය කිරීම සඳහා වූවක් විය. තවද සනාන්දාජ් කැරැල්ල ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා වූවක් ද විය. 1979 මාර්තු සිට අගෝස්තු දක්වා ඉරානයේ ප්‍රධාන වාම සංවිධාන අභ්‍යන්තර සාකච්ඡාවන් විෂයයෙහි අවධානය යොදා සිටීමත්, නොවැළැක්විය හැකි පරිදි කුර්දි ජාතිකවාදීන් යුහුසුළුව සංවිධානය වීමේ කටයුතු කරගෙන යන ලදී. ඔවුහු ඉස්ලාමීය හමුදාව සමඟ මතු කෙරෙන්නා වූ තීරණාත්මක සටන සඳහා සූදානම් වූහ. 1979 අගෝස්තු වන විට ඉස්ලාමීය පාලන තන්ත්‍රය වාම විරුද්ධ පාර්ශවයන් මැඩ පැවැත්වී යයි හැඟී ගිය අතර ම ඉස්ලාම් විප්ලවකාරී කණ්ඩායම් කුර්දි නගරවලට සහ ගම්වලට ඇතුළු වීම ආරම්භ විය. (එය නීතිය සහ යහපැවැත්ම ස්ථාපනය කිරීම සඳහා යයි පවසන ලදී.) අර්බුදයේ අනිවාර්ය ප්‍රතිපලය ලෙස කොමෙයිනි කුර්දිස්ථානයට එරෙහිව ශුද්ධ වූ යුද්ධය ප්‍රකාශයට පත් කරන ලද අතර එහි සුවිශේෂ වශයෙන් කුර්දි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (KDP) පිළිබඳව අවධානය යොමු කළේය. KDP ය කුර්දිස්ථානය තුළ මනා ලෙස සංවිධානය වූත් බලපෑම් එල්ල කල හැකි වූත් පක්ෂය විය. වාම සන්ධානයට විරුද්ධව ගත් කළ අගෝස්තුවේ බිඳ වැටීමේ ක්‍රියාන්විතය සාර්ථක වූ නමුදු කුර්දිවරුන්ට එරෙහිව වූ ක්‍රියාන්විතය අසාර්ථක වූවක් විය. හමුදාව තුල මෙම යුද්ධය සඳහා වූ නැඹුරුව සහ ආතතිය සුළු ප්‍රමාණයක් විය. මේ අතර ඉස්ලාමීය විප්ලවකාරී කණ්ඩායම් Psdaran කුර්දි ගරිල්ලාවරු Pesmergas අතින් දැඩිසේ අපහසුතාවයට පත් විය. යළි වතාවක් එකඟතාවයකට රැගෙන ඒමේ උත්සාහයක් ආගමික ලිබරල්වාදීන් සහ පූජ්‍ය පක්ෂය මැදහත්කරුවන් ලෙස සහභාගී වෙමින් සිදු විය. (උදාහරණ ලෙස අයතුල්ලා තලෙගානී, ගොසික් අලි ටෙහෙරානි, බානිසාදර් ආදීහු) කොමෙයිනීගේ ඉරාන විප්ලවීය හට කණ්ඩායම් (IPP) ස්වපාලනය පිළිබඳ සිය ස්ථාවරය එකඟතාවයක් සඳහා භාවිතා කිරීමට එකඟ නොවූහ. 1979 දෙසැම්බරයේදී KDP නායක ක්වාසිම්ලූ Qasemlu පාලන තන්ත්‍රය සමඟ එකඟතාවයකට පැමිණීමේ ක්‍රියාවලියකට ඉඩ ලබා දෙන ලද ප්‍රකාශයක් ප්‍රංශයේ Le Monde පුවත්පත සමඟ 18 දෙසැම්බර් 1979 පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ඔහු ලබා දුන්නේය. ඔහු කියා සිටියේ "....ඔවුන්ගේ දර්ශණවාදයේ ලක්ෂණයන්ට වඩා ඔවුන් යොදන බලයේ ප්‍රමාණය විශාලය. ඒ නිසා මම කුර්දි ජනතාවගේ එකඟතාවයකට වූ ඉල්ලීම ඉවත නොදමුවෙමි....." ඇත්ත වශයෙන්ම බලය පිළිබඳ සම්බන්ධතාවයන් විෂයෙහි එය අතිශය තීරණාත්මක සුළුතර ජන කණ්ඩායමක ප්‍රතිරෝධය දැක්වීමේ භූමිභාගයක් විය.

ඉස්ලාමීය පාලන තන්ත්‍රය 1980 මාර්තු මාසයේ දී කුර්දිස්තානට එරෙහිව යුද්ධය යළි ආරම්භ කළෝ ය. 1979 දෙසැම්බරයේ දී ඉරාකය සමඟ යුද්ධය ආරම්භ වන විට කුර්දිස්ථානයේ ඉරාන හමුදා සේනාංක 04 ක් ක්‍රියාත්මක වූ අතර ඊට අමතරව Psadaran ඉස්ලාමීය විප්ලවකාරී හට කණ්ඩායම් ක්‍රියාත්මක වූහ. පසුව සඳහන් කළ කණ්ඩායම් කුර්දි වරුන්ට එරෙහිව කඩාකප්පල්කාරී ක්‍රියාවල නිරත වූහ. ජාතිකත්වයේ සංකේතය බඳු වූ මහාබාද් Mahabad නගරයට ගුවන් හමුදාව බෝම්බ හෙළන ලදී. කුර්දි ගරිල්ලෝ Peshmergas දැනටමත් ප්‍රධාන නගරවලින් ඈත්වීම ආරම්භ කොට සිටියහ. ඒ කුර්දි ජනතාව සමූල ඝාතන අනතුරකට මුහුණ දීම වැළැක්වීම සඳහා විය. තවද තම අරගලය කඳුකර ප්‍රදේශ කරා රැගෙන යෑමටත් ය. කඳුකරයේදී ඔවුහු අනභිබවනීය වූහ. පරාජය කළ නොහැකි වූහ. එහි කුර්දි ප්‍රතිවිරෝධී කණ්ඩායම් ද වූහ. කඳුකර භූමියෙන් වර්ග කිලෝ මීටර් 60,000 ක ප්‍රමාණයක් ඔවුහු පාලනය කළෝය. කුර්දිස්ථානය ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන්ගේ ශෛලමය ප්‍රාකාරයක් විය. KDP ය ජාතික පතිවිරෝධී කවුන්සිලයට සම්බන්ධ වූ ප්‍රථමයන් අතර විය. ගරිල්ලාවරු 12,000 ක් සන්නද්ධ සිවිල් වැසියන් 20,000 කට එරෙහිව 45,000 ක නිත්‍ය ඉරාන හමුදාවක්, 12,000 ක් වූ ඉරාන විප්ලවීය හටයන් සමඟින් යෙදවූයේ නමුත් ඒ වන තෙක්ම කොමෙයිනී පාලන තන්ත්‍රයට කුර්දි ජනයා පරාජය කිරීමට නොහැකි විය.

## කලහකාරීන් තලා දැමීම

සාමාන්‍ය වශයෙන් අරාබියානු වාමාංශයේ සහ කුර්දි ජාතික ව්‍යාපාරයේ අවාසනාවකට මෙන් ඉස්ලාමීය ජන රජය තුළ දී (සිය ප්‍රථම වසර තුළ) සුළු ජාතික සහ වාර්ගික කණ්ඩායම්වල කැරලිකරුවන් පරාජය කිරීමට අවස්ථාව ලැබිණ. කෙසේ වෙතත් කෙටි කාලයකට 1979 මුල් මාස කිහිපයේ දී ඉස්ලාම් ජන රජය කැරලිකරුවන් විසින් වට කරනු ලැබූ ආකාරයක් පෙනෙන්නට තිබිණි. මෙම කැරළිකාර ජාතික හමුදාවන් උතුරින් තුර්ක්වේනියානුවන්, දකුණින් බලුකිස්තානුවන් සහ අරාබිවරුන් ගෙන්ද සමන්විත වූහ. ඇතැම් බලුකිස්තාන බුද්ධිමතුන්, පූජකවරු, ව්‍යාපාරිකයෝ, රහසිගත දේශපාලන සංවිධානයන් ඉස්ලාම් එක්සත් පක්ෂය IUP ය පිහිටවා ගත්තෝය. බලුචි ජාතිකත්වය පිළිබඳ උද්ඝෝෂණ එහි අරමුණ විය. බලුකිස්ථාන ජනතාව ජීවත් වූයේ සාමාජීය වශයෙන් සහ ආර්ථික වශයෙන් දුර්වල සහ පසුගාමී පාලන ප්‍රදේශයකයි. නොතකා හරින ලද සහ බලය යොදා යටපත් කළ ඔව්හු ජීවත් වූයේ වඩා නිවැරදි ව සහ හොඳින් ප්‍රකාශ කළ හැකි ආකාරයට ගෝත්‍රිකත්වය සහ ජාතිකත්වය අතර දෝලනය වෙමිනි. කෙසේ වෙතත් ඔවුන්ගේ අපේක්ෂාව වූයේ පාකිස්ථානය සහ ඉරානය අතර වූ ස්වරාජ්‍යයයි. මේ සඳහා වූ බලුචි වරුන්ගේ එක්සත්භාවය සරලව තේරුම් නොගත යුතු බවය. IUP ය ස්වපාලනය ඉල්ලා සිටි නමුත් වඩා කලහකාරී Radical සහ වාම කණ්ඩායම් හි අවයවයෝ "ස්වාධීන එක්සත් බලුකිස්ථානයක්" ඉල්ලා සිටියෝ ය. කුර්දිවරුන් මෙන් නොව බලුචිවරුන්ගේ අරගලය තවමත් ඉස්ලාමීය රාජ්‍ය තන්ත්‍රයට විභව්‍ය අනතුරක් ඉදිරිපත් කර තිබුණේ නැත. කෙසේ වෙතත් සංවිධානය වන්නේ නම් සහ පාකිස්ථානයේ ජීවත් වන බලුචි වරුන් සමඟ එක්සත් වන්නේ නම් ඔවුන්ට කොමෙයිනී පාලන තන්ත්‍රයට මතු නොව සියා උල් හක් ඒකාධිපතිත්වයට එරෙහිව ද අනතුරුදායක බලපෑමක් එල්ල කිරීමේ හැකියාව තිබිණ.

1979 මාර්තු අවසන් භාගයේ දී උතුරේ තුර්ක්මේනියානු කැරලිකරුවන් රුසියානු දේශ සීමාවේ Ganbad e qubas නගරය අත්පත්කර ගත්තේ පොලිසිය සහ හමුදා හට මූලස්ථානය යටතට ගැනීමේ ප්‍රතිපලයක් වශයෙනි. මේ මගින් ඔවුහු ඉස්ලාමීය අධිකාරියට අභියෝග කළහ. තුර්ක්මේනියානු ස්වරාජ්‍යය සඳහා වූ උත්තරීතර කවුන්සිලය දේශපාලන සහ ආර්ථික ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කළ අතර එහි ප්‍රධාන පදනම් කරුණු දෙකක් වූයේ ස්වපාලනය සහ තුර්ක්වේනියානු භූමිය යළි ඔවුන් වෙත පැවරීම යි. දින කිහිපයක් ගත වන්නට මත්තෙන් ඉරානියානු සන්නද්ධ හමුදා පෙරටුව විශාල ඉස්ලාමීය විප්ලවකාරී හට කණ්ඩායම් ද සමඟ Ganbad නගරය යළි අත්පත් කර ගන්නා ලද්දේ බිහිසුණු සටන්වලින් අනතුරුවයි. Ganbad සටන දින 10 ක් පැවතුන අතර තුර්වේනියානුවන් 400 ක් මරා දමන ලදී. නමුත් ඒ පරාජය තුර්ක්වේනියානු අරගලය අවසානයක් කරා ගෙන ආවේ නැත.

වැඩිකල් නොගොස් නිරිතදිග ප්‍රදේශයෙන් ඉස්ලාමීය පාලන තන්ත්‍රයට අභියෝග එල්ල විය. කෙසේ වෙතත් එය මෙම අවස්ථාවේදී කළු රත්‍රන් Black Gold (තෙල්) නිධි සහිත භූමියේ වූ අතර එය කොමෙයිනී පාලන තන්ත්‍රයේ තත්ත්වයට අවදානමක් විය. 1979 වස්සාන කාලය අවසානයේදී තෙල් සම්පතින් පොහොසත් ප්‍රදේශය පුපුරා ගියේ ය. වරාය සහිත මුහුදු බඩ නගරයක් වූ කොරොම්ශාර් Khorrm Shahr වල දරුණු සටන් අරඹිණි. අරාබි ජාතිකවාදීන් එක් පසෙකත් අනෙක් පසින් ඉරාන හමුදා, ඔවුන්ට සහාය දුන් නාවික හමුදා ප්‍රහාරක බෝට්ටු කමාන්ඩෝවරු, ඉස්ලාමීය ආරක්ෂක හටයෝ සහ කොමිටේ Komiteh තුවක්කුකරුවන් වූහ. ඔවුන් මෙහෙයවනු ලැබුවේ ගවනර් ජනරාල් අද්මිරාල් මදාවී විසිනි. ඒ සියළු ආකාරයේ ආරාබි පතිවිරෝධතා තලා දැමීම සඳහා යි. මාස 02 ක කාලයක් පමණ වූ අර්බුදකාරී වාතාවරණය මැද බොහෝ ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගත් අතර ඉස්ලාමීය විප්ලවීය අධිකරණය මගින් එල්ලා මරා දමන ලදී. චෝදනාව "දෙවියන්ට එදිරිව සටන් කිරීම" යි. ප්‍රදේශය සුවිශේෂ ආකාරයක නිහඬතාවයකට පත් වූ අතර එය ඉරාන-ඉරාක යුද්ධයේ යුධ කලාපයක් බවට පත් වන තෙක් පමණක් පැවතිනි. කෙසේ වෙතත් අරාබි ජාතික සටන්කාමීන් මරා දැමීම කිසිදු සැකයකින් තොරව ම දැවැන්ත සලකුණක් විය. වැඩිහිටි අරාබි කාන්තාවක් පැවසුවේ "....අපි හිතුවේ කොමෙයිනී අපිට පාසැල් සහ ජලය ලබා දේවි කියලා. ඒ වෙනුවට ඔහු මිනිසුන් එව්වා මිනී මරන්න...." යනුවනි.

1979 දෙසැම්බරයේදී කොමෙයිනී ගේ හමුදා ප්‍රහාරය නැවතත් ආරම්භ විය. එය මෙම අවස්ථාවේ අසර්බයිජානයේ අගනුවර වූ ටැබ්රිස් කරාය. ඒ කැරළි කෝලාහල මැඩ පැවැත්වීම සඳහා ය. ටැබ්රිස් හි ජනතා නැගිටීම ස්වපාලනය සඳහා වූවක් නොවී ය. අයතුල්ලා කොමෙයිනීගේ සහ අයතුල්ලා ශෙරික් මදාරිගේ ආධාරකරුවන් අතර වූ සටන් සඳහා පෙළ ගැසීමක් විය. ( A show down )

අසර්බයිජානුවන්ට ස්වපාලනය සඳහා අරගලයේ දීර්ඝ ඉතිහාසයක් ඇති මුත් ටැබ්රිස් කැරලිකරුවන් නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ බලාධිකාරය අහෝසි කරන ලෙසත්, අවලංගු කරන ලෙසත් ඉල්ලා සිටියෝ ය. එමඟින් අයතුල්ලා ශෙරික් මදාරියේ අනුගාමිකයෝ සහ හිතෛෂීව සිටියෝ ඉවත් වූහ. එය සුවිශේෂ ප්‍රවේශයක් විය. අසර්බයිජාන්වරු එයට සහයෝගය දැක්වූයේ නම් එය පැතිරුණු කැරැල්ලක් වීමට ඉඩ තිබිණ. කෙසේ වෙතත් සියළු දේශපාලන පක්ෂ, KDP ය, ෆෙඩායින්වරු Fedayeen (මොවුහු ආරම්භයේ දී සහයෝගය දැක් වූ නමුත් පසුව තම ස්ථාවරය ආපසු හරවා ගත්තෝ ය.) මුජෙහිඩීන්වරු Mojehedin කිසිවෙක් කැරැල්ලට සහභාගී වීම සඳහා එක් පියවරක් හෝ තැබුවේ නැත. කැරැල්ල තලා දමන ලද්දේ කොමෙයිනී අනාගමික ප්‍රහාරක කණ්ඩායම් මගිනි. අසර්බයිජාන්වරු - ඉරානයේ විශාලතම සුළු ජන කණ්ඩායම, එතැන් සිට නිහඬ වූහ. ඉරානයේ සුළු ජන කණ්ඩායම්වල ඔවුන්ගේ ස්වතීරණ ගැනීම සඳහා වූ අරගලය ඉස්ලාම් තන්ත්‍රය විසින් යටින් වල හාරා බිඳ දමන ලද්දේ වුවත් ඔව්හු ඉස්ලාමීය පාලන තන්ත්‍රයට එරෙහිව ස්වාධීන සාධකයක් ලෙස ඉස්මතු වීමේදී බලරහිත වූහ. ඒ හේතුවෙන් ස්වයංතීරණය සඳහා වූ අයිතිය වියුක්ත වූ මූලධර්මයක් පමණක් නොව සමාජ විප්ලවය සඳහා වූ බලයක් බව සැලකිය යුතුය.

(බ්‍රිතාන්‍යයේ ප්‍රකාශයට පත් කෙරුනු **රැමී නීමා** නැමැති ඉරාන සමාජවාදියෙකුගේ **"WRATH OF ALLAH "** කෘතියෙන් උපුටා ගෙන පරිවර්තනය කරන ලද්දේ **නිමල් චන්ද්‍ර ගෝවින්දන්** විසිනි.)